


# සුදුඅක්කා සහ ඇවැස්ස දීගය

මට වඩා අවුරුදු හතරකින් පමණ වැඩිමහල් සුදු අක්කා සුදු ය. ලස්සන ය. තරමක් මිටි ය. ඇය අප සමග හැදුණත් වැඩුණත් නිවැරදිව ම කීවොත් අප හැදුණේ වැඩුණේ සුදු අක්කාගේ සෙවණ යටතේ ය.

සුදු අක්කාට වැඩිදුර පාසල් යාමට හැකියාවක් ලැබී නැත. වසර දෙකෙන් දෙකට අම්මාට ලැබෙන දරුවන් රැක බලා ගැනීමේ වගකීම පැවරුණේ ඇයට ය. අම්මාත් තාත්තාත් රබර් කිරි කැපීමේ රැකියාවට යාම සහ ගොවිතැන් වැඩවල යෙදීම නිසා අප නිවසේ බොහෝ කාර්යයන් සිදුවුණේ සුදුඅක්කා අතින් යයි පැවසිය යුතු වන්නේ ඇගේ සෙවණ මට බාල අප බොහෝ දෙනෙකුට සිසිලසක් ගෙනඳුන් නිසා ය. යන්තම් වයස දහය දොළහ වයසේ දී ම ඇයට පැවරී තිබුණු කාර්යයන් බොහෝ ය. ඉර පායන්නත් කලින් අම්මාත් තාත්තාත් රබර් කට්ටියට යන්නේ කූඩැල්ලන් එල්ලෙනවාට දෙකකුල්වල සබන් තවරාගෙන, පිඟන් කටු කැබැල්ලකින් කිරි පිහිය මුවහත් කරමිනි. ඔවුන් නිවසින් පිටවීමත් සමග ම සුදු අක්කාට පැවරෙන රාජකාරි ප්‍රමාණය අති විශාල ය. පාන්දරින් අවදිවන අම්මා දිනපතා ම වාගේ අපට උදේ ආහාරය වශයෙන් සෑදිය යුතුවන රොටි කීපය සඳහා අවශ්‍ය පාන්පිටි ඒදුම සකසා එළියට බහින්නේ කලබලයෙනි. ඉන්පසු නිවසේ සියලු ම කාර්යයන් පැවරෙන්නේ සුදුඅක්කාට ය. පවුලේ බාලයන් දෙදෙනා වන නිමල් සහ වසන්ත හැරෙන්නට මට බාල අනිත් සියලු ම දෙනා මේච්චල් කර ගත්තේ ඇය ය. බාලයන් පරිස්සම් කරගෙන පොල්රොටි කීපය පුළුස්සා අම්මාගේ සහ තාත්තාගේ රොටි දෙක වෙන්කොට ඇතිළියකට දමා තවත් ඇතිළියකින් වසා තබා අපගේ රොටි අපට කන්නට දෙන්නී ය. මටත් ගුණපාල මල්ලීටත්, කන්නට දී ගුණපාල මල්ලී සහ මා පාසල් යාම සඳහා පිටත් කරවන්නේ ගුණපාල මල්ලීගේ ඇඳුම් අන්දවා ජෑක් එක පීරා, මුහුණ දෙපස පවුඩර් අතුල්ලා ලස්සන කිරීමෙන් පසුව ය. මට මගේ ඇඳුම් ඇඳගෙන අවශ්‍ය සියල්ල කරගත හැකි ය.

එවකට දුවපැන ඇවිදින වයසේ වූ සිරිපාල මල්ලීට ද කිරි බෝතලයක් සකස් කර පොවමින් ඇරඹෙන දවසේ රාජකාරිය අවසන් වන්නේ රාත්‍රියට උයාපිහා අපට කන්නට දී වළං පිඟන් සෝදා තබා ගේ දොර අස්පස් කොට අතුගා අපට නිදියා ගැනීමට පැදුරුත් එළා දීමෙන් පසුව ය.

අප පාසලට ගිය පසු, රෙදි තොටිල්ලේ නැළවෙන මැණිකෙ නංගීගේ කිරි බෝතලය පොවා චූ රෙදි කක්කා රෙදි සෝදා පිරිසිදු කරන්නේ ඇයයි. ඊ ළඟට උපන් සුනිල් සහ රණවීර මල්ලීගේ කුඩා කාලය දක්වා ඔවුන්ගේ සියලු ම කාර්යයන් ඇයට පැවරුණේ ඇයට උපතෙන් ම අයත් වූ කාර්යයන් හැටියට ය. එම ක්‍රියා කාරිත්වය පිළිබඳව අද සිතෙන විට පුදුම ය. එවකට ගෑස් ළිප්, ග්‍රයින්ඩර්, වතුර පයිප්ප යනාදිය තිබුණේ නැත. ළිප පත්තු කිරීම සඳහා දර රබර් වතුවලින් හා කැලයෙන් සොයා ගත යුතු ය. ඒවා කපා පළා සිහින් කොට ගත යුතු ය. වී, වංගෙඩියෙන් කොටා සහල් කර ගත යුතු ය. වතුර ගෙන ඒම සඳහා තරමක් දුර ඇති ළිඳකට කළගෙඩි සහ පනිට්ටු රැගෙන යා යුතු ය. ව්‍යංජන සඳහා අවශ්‍ය වන මිරිස්, ගලේ අඹරා ගත යුතුය. පොල් බිම් හිරමණයෙන් ගා අතින් මිරිකා ගත යුතු ය. වරින් වර නිවෙන ළිපට වරින්වර පිඹ ගිනි ඇවිලිය යුතු ය. අපේ ඇඳුම් කීපය ළිඳ ළඟට ගොස් සබන් ගා ගලේ ගසා සෝදා පවිත්‍ර කිරීමේ කාර්යය ද ඇයට බාර ය. එවකට රෙදි සෝදන, වියළන මැෂින් පිළිබඳව අසන්නටවත් නැත. රාත්‍රියේ දී සියලු ම වැඩ කළේ ද භූමිතෙල් කුප්පි ලාම්පු එළියෙනි.

අම්මා සහ තාත්තා රබර් කිරි කපා නිවසට පැමිණෙන විට ඔවුන් වෙනුවෙන් සාදන ලද රොටි කෑමට ලුණුමිරිසක් තලා තබා තේ කහට වත් කිරීම සඳහා වතුර කේතලය ළිප තැබිය යුතුවේ. දවල්ට ඉවීම සඳහා වැඩ ආරම්භ කිරීම කරන්නේ මේ කාර්යයන්ගෙන් පසුව ය. එළවළුවක්, කරවල හොද්දක් සහ බත් හැළියක් ඉවීමට ඇයට එතරම් කාලයක් ගත නොවේ. අම්මලා කිරි කපන අතරතුර වැහැගෙන එන ලකුණු ඇතිවුණා හොත් කිරි ඇකිළීමට ඇති බාල්දි පනිට්ටු ඔසවාගෙන කිරි කට්ටිය පැත්තට සුදු අක්කා දුවන්නේ එක හැල්මට ය. කැපූ ගස්වල කිරි වැස්සට අසු වන්නට පෙර දුවදුව අකුළා ගැනීමට ඇය උදව් කරන්නේ තෙමී ගෙන ය. අකුලා ගෙන එන කිරි පෙරා ඇසිඩ් දමා මිදෙන්නට හැර මිදුණු පසුව රබර් ෂීට් දහයක දොළහක පමණ ප්‍රමාණය රොටි තලන ලෑල්ලෙන් තලා, වැලි බෝතලයෙන්



තුනී කොට ඩයමන් ගැසීම සඳහා ගෙන යා යුතු ය. මහපන්විල ඩයමන් රෝලට ගෙන යන රොටි ඩයමන් ගසනු ලබන්නේ සියදෙ-ර්රිස් අයියා නම් වූ තරමක් වියපත් අයෙකි. මහපන්විලට රොටි ගෙන යාමට තාත්තා සහ අම්මා සමග අප කවුරු හෝ යා යුතු වන්නේ අමු රොටි බෙහෙවින් බර නිසා ය.

එක් දිනක සිදු වූ අපූරු සිදුවීමක් මතකයට නැගෙන්නේ අද ද හසරැල්ලක් සමග පුපුරු ගසන වේදනාවක මතකයක් සමගිනි. අම්මා, තාත්තා සහ සුදු අක්කා රොටි ඩයමන් ගැසීම සඳහා මහපන්විලට ගොස් ය. ඔවුන් ගිය පසු තරමක ලොකු අයට ගෙදර ඉතිරි වූයේ ගුණපාල මල්ලී සහ මා පමණ ය. අනිත් අය පුංචි ය. අප දෙදෙනා ටීක්බෝල සෙල්ලම් කරමින් සිටින අතර ගුණපාල මල්ලී එක විටම ගෙන ආවේ පැණිරස යෝජනාවකි.

''අයියෙ අපි වැඩක් කරමු.''
''මොකක්ද?''
''අපි සීනි කමු.''
''හා කමු. කොහෙද තියෙන්නෙ?''
''දුමේ''
''කොහොමද ගන්නෙ?''
''පුටුවක් තියල ගමු.''

දැන් අප දෙදෙනා අරඅඳින්නේ මහා හොරකමක් කිරීමට ය. ඉස්තෝප්පුවේ සිට කුස්සියට පුටුව ඔසවාගෙන ගියේ මා ය. සීනි කෑමට උපදෙස් දෙන්නේ ගුණපාල මල්ලී ය.

''අයිය නගින්න. නැගල ගන්න. මටත් දෙන්න. ඔයත් කන්න.'' ඔහුගේ උපදෙස් පරිදි ම ක්‍රියාත්මක වුණෙමි. දුම උඩ වළඳක් තුළ ඔබා තිබූ සීනි ටිං එක එළියට ගෙන අප දෙදෙනා ම ඇතිවනතුරු රතු සීනි කෑවේ කට දෙපසින් රූටා වැටෙන සීනි ගැන ද නොතකා ය. දැන් සීනි කෑවා ඇති ය. ඊ ළඟට ගුණපාල මල්ලී ගෙන ආ අනිත් යෝජනාව ද ඊටත් වඩා රසවත් ය.

'අයියෙ උම්බලකඩ තියෙන තැන මං දන්නවා. කමුද?''

සුදු අක්කා උම්බලකඩ කපන වේලාවක ඇයගෙන් පුංචි උම්බලකඩ පොඩි පතුරක් දෙකක් උදුරාගෙන පොල් සමග විකන විට ඇති රසය මගේ දිව ඉල්ලන්නට පටන් ගත්තේ මටත් නොදැනී ම ය.

''කමු කමු කොහේද තියෙන්නෙ?'' සීනි හොරකමට හුරුවුණු දෑත් උම්බලකඩ හොරකමට ද අමුත්තක් නොවන තත්වයට පත්ව ඇත.

''ඔන්න ඔය ඔතන තියෙන වළඳට එහායින් තියෙන වළඳ ඇතුළෙ උම්බලකඩ තියෙනවා. අත දාල ගන්න.''

මට උම්බලකඩ සොයා ගැනීමට එතරම් අපහසුවක් වූයේ නැත. තරමක උම්බලකඩ කැබැල්ලක් ගෙන දෙකට කපා දෙන්නා සමග කෑවේ පොල් ද උලුප්පා ගෙන ය. පුටුව ද යළි ඉස්තෝප්පුවට ගෙනැවිත් තබා අප නිදහස් වූයේ කිසිත් නොකළ අය ලෙස ය. දැන් අප දෙදෙනා බොහෝ එකමුතු ය. දෙදෙනා ම සීනි සහ උම්බලකඩ කෑමෙන් තෘප්තියට පත් වී සිටින්නෙමු.

''මල්ලියෙ අපි හෙටත් කමු. කාටවත් කියන්න එපා. හොඳේ. ''

''අයියත් කියන්න එපා හොඳේ'' අපි දෙදෙනා පොරොන්දු දී ගතිමු.

දැන් අම්මලා ගෙදරට එන වෙලාව හරි ය. නැවත මිදුලේ ටීක් බෝල සෙල්ලම් කරන්නට පටන් ගත්තේ කිසිවක් නොදන්නා අය ලෙස ය. මුලින් ම සුදුඅක්කා, ඊ ළඟට තාත්තා, ඊ ළඟට අම්මා පේළියට එන්නේ රබර් ෂීට් ගෙන ගිය තැටි අතේ එල්ලා ගෙන ය. අක්කාත් තාත්තාත් නිවස තුළට ගියෝය. අන්තිමට පැමිණි අම්මා මිදුලට අඩිය තබනවාත් සමගම ගුණපාල මල්ලී අම්මාගේ අතේ එල්ලී ගත්තේ ය.

''අම්මෙ අයිය හොරෙන් උම්බලකඩයි සීනියි කෑව''යි පැවසුවේ අම්මා සමග හුරතල් වෙමිනි.

මා වෙවුලන්නට පටන් ගත්තේ සිටිසිටි යන අනුකරණයෙනි. දැන් ඊරිය කෝටු පාර කන්නට සිදුවීම සිකුරු ය. අම්මා අත තිබුණු තැටිය බිමට අතහැරියේ කේන්තියෙනි. වහා වේගවත් ගමනින් ගියේ පිළිකන්න පැත්තේ කපා ඉතිරිව දළුලමින් වැඩෙන ඊරිය කොටය ළඟට ය. ඇය වේගයෙන් ඊරිය ඉත්තක් අතින් ඇද කඩා කොළ ටික සූරා දමමින් ආපසු මා වෙතට එන විට මා මර ළතෝනි දෙමින් කෑ ගසන්නට පටන් ගත්තේ ගහන්නටත් පෙර ය. මා ගුටි කන අයුරු පසෙකට වී බලා සිටින ගුණපාල මල්ලී සිනාසෙන්නේ අත්පුඩි ගසමින් උඩ පනිමින් ය. පහරවල් කීයක් ගැසුවා ද, පහරවල් කීයක් කෑවා ද කියා අම්මාවත් මා වත් නොදනිති. කෝටු පාරවල් වැදී පැලුණු තැන්වල පොල් තෙල් ගෑවේ සුදුඅක්කා ය.

**මතු සම්බන්ධයි**